## කවි කොළය

### ප්‍රභාකරන්ගේ බිරිඳ
# මදිවානි කතා කරයි!

මස් මඩුවකට දැක්කු මී ගොනෙකු වගේ
වෙව්ලා මර බියෙන් හිරිගඩු පිපුණු ඇඟේ
ඔබ නිදි මරණ හැටි දක්නට උමග දිගේ
මොන පාපයක් කෙරුවද නෙත් සඟල මගේ

කිලිනොච්චියද ජයගත් බල සෙනග හෙට
සැක නැහැ වසනු ඇත මෙම බංකරයෙ කට
ඉන්පසු ඌරු මීයන් මෙන් පොළව යට
මැරි මැරි ඉන්න සිදුවෙයි ඔබ සමග මට

හඳහන ඔබේ ගෙනගොස් රාමන් ලව්වා
මාරක අපල ග්‍රහ දොස් ඇත්දැයි සෙව්වා
අවුරුදු පණස් පහ පන්නනු බැහැ කිව්වා
වහ කනවා මිසක ඉවසන්නද මෙව්වා

කයිවාරුවට පළමුව බොරු මහ වීර
අවි බිම තබා වෙන්නට රජයට බාර
මා අඬ අඬා කිව්වත් හත් අට වාර
පැන්නා නේද නැවතත් කටට ම මාර?

පණුවෝ මැරෙති ඇවිලෙන ගින්දරට බඩේ
වැසිකිළි දුවයි බයටම තුන් හතර විඩේ
වැඩිවී ඇඳුම් තෙත් වන මහ කරුම ලෙඩේ
රෙදි සෝදන එකයි මට ඇති එකම වැඩේ

ඉස්සර ළඟට එනවිට මොන සනී පද
මම පෙම් කළෙමි මරණය පෙනි පෙනී හිඳ
අද ඔබ ළඟට එනවිට ගිනිගැනී හද
ඩහදිය ගඳ මකා මතුවෙයි මිනී ගඳ

එන විට වන්නි කඳවුරු එක දිගට වැටී
හීනෙන් පවා ඔබ බිය වී හඬන හැටී
දුටුවොත් ඔබේ හමුදාවේ සිටින කොටී
අවි බිම තබා වහ කා මිය ඇදෙනු වටී

මිතුරන් ඇතත් දකුණේ මංගල වාගේ
වචනෙට පමණක්ය ඔවුනගෙ සහයෝගේ
කරුණානිධි සමග වයිකෝ දෙදෙනාගේ
මඩ ගොහොරුවක එරිලා ඇත බරබාගේ

රජ පද ලබා
ඊළාමයෙ අබි මානී
වෙන්නට සිහින මැව්
ඔබගේ මහ රාණී
මේ ඔබෙ දයාබර
බිරිඳය මදිවානී
(තරහට කියති සතුරෝ
වේලුගෙ ගෑනී)



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**



# උපතින්ම දෙපා නැති මැරතන් ශූරයා
## දෙපා නැති අයට දිරිය දෙන පින්තූරයක්

**එං**ගලන්තයේ නොටිංහැම්ෂයර්හි උපන් ඔහුට උපතින්ම දෙපා නැත. එහෙත් ආබාධිතයින් වෙනුවෙන් කෙරෙන සෑම කටයුත්තකදීම ඔහු පෙරමුණගනී. ඔහු හොකී තරඟවලට සහභාගි වේ. පිහිනුම් ශූරයෙකුද වෙයි. 28 හැවිරිදි රිචර්ඩ් වයිට් දැන් ප්‍රසිද්ධව ඇත්තේ මැරතන් ශූරයෙකු ලෙසය. ලොව කොතැන ධාවන තරඟයක් තිබුණද ඔහු ඊට සහභාගි වන්නේය. සති 6 ක් තුළ ලෝකයේ මහාද්වීප තුනක මැරතන් හතර හමාර කට සහභාගි වී ඇති ඔහුගේ හැකියාව විශ්මයජනකය. 80,000 ක් ධාවක යින් සහභාගිවුණු පසුගිය ලන්ඩන් මැරතන් තරඟයේදී එය නිමකරන්නට රිචර්ඩ් ට ගතවුණේ පැය 3 විනාඩි 22 කි. ඔහුට ලැබුණු අත්පොළ සන් හා ප්‍රීතිඝෝෂාව අතිවිශාල ය. එය ඔහුට ඉමහත් දිරියකි. සතුටකි.

ආබාධිතයින්, පිළිකා රෝගීන් හා වෙනත් අසරණ සරණ කටයුතු සඳහා ඔහු මෙසේ ධාවනයේ යෙදීමෙන් උපයා දී ඇති මුදල් ප්‍රමාණය විශාලය. එසේම ඔහුගේ ක්‍රියාවෙන් දිරි ලබමින් නොයෙක් ක්‍රීඩාවන්හි දැන් දැන් නියුක්ත වන ආබාධිතයින් ගණන දිනපතා වැඩි වන බව ආබාධිත යින්ගේ සංවිධාන පෙන්වා දෙයි.

පසුගිය 30 දා ලෙබනනයේ බේරූට් නගරයේ පැවති මැරතන් ධාවන තරඟයකට සහභාගිවූ අවස්ථාවේ ඔහු ලෙබනීස් හමුදා ආරක්ෂක භටයෙකු පසුකරමින් තරඟය අවසන් වන ස්ථානයට ළඟා වෙන අයුරුය මේ.

Richard Whitehead, a British disability activist who was born without legs, competes as he runs past a Lebanese soldier during the annual Beirut Marathon in Beirut, November 30, 2008. Thousands of people took part in the run which started in the Lebanese capital.



## කොළඹ විත්ති

# මාලිගාවත්ත මහල් නිවාස සංකීර්ණයේ ළමා අපචාර ගුහාවක් වටලති

**කො**ළඹ මාලිගාවත්තේ ජාතික නිවාස සංකීර්ණයේ මහල් නිවසක කාලයක් තිස්සේ පවත්වාගෙන ගිය ළමා අපචාර ක්‍රියාවලියක් බස්නාහිර පළාතේ විශේෂ පොලිස් ඒකකය මගින් වටලා එම අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමට සමත්ව ඇත. එම නිවස කුලියට ගෙන තිබුණේ ශ්‍රී ලංකා ජාතික පදනම් අයතනය යන නමිනි. එහෙත් එය ව්‍යාජ ආයතනයක් බවත් එය කලක් තිස්සේ පිරිමි ළම යින් ගෙනැවිත් අපචාරය සඳහා යොදා ගෙන ඇති ගණිකා නිවසක් වූ අතර විවිධ පුද්ගලයන්ට ලිංගික කායයීයන් සඳහා පිරිමිළමයින් කුලි යට සපයන ස්ථානයක් බවත් පොලීසිය සොයාගෙන ඇත.

පොලිසිය එම ස්ථානය වටලන් අවස්ථාවේ එම නිවසේ කාමරයක මැදිව්යේ පුද්ගලයෙකුද කුඩා පිරිමි ළමයින් දෙදෙනෙකුද සිටි බව කියති. මැදිව්යේ පුද්ගලයා එහි ඇඳක් මත සිටියේ නිරුවතිනි. එහි ලිංගික දර්ශණ රැගත් විඩියෝ පටයක්ද එවෙලේ ක්‍රියාත්මකවෙමින් තිබී ඇත. ඒ ළමයින් දෙදෙන සුනාමියෙන් අනාථව අනාථ කඳවුරක සිටින දරුවෝය. ප්‍රශ්නකරද්දී එම පුද් ගලයා කොළම ආසන්න පොලීසි යක පොලිස් සාජන් කෙනෙකු බව ද හෙළිවීය. ඔහු අත්අඩංගුවට ගත් පසු පොලිසිය ඔහු සැපයූ තොරතුරු වලට අනුව මෙම බොරු ජාතික පදනම් ආයතනය නිර්මාණය කළ පුද්ගලයා සොයා අත්අඩංගුවට ගත්තේය. ඒ තැනැත්තා චීවරධාරි යෙකු බවත්, භික්ෂුවක ලෙස පෙනී සිටිමින් විවිධ ව්‍යාපාර පවත්වගෙන යමින් මුදල් උපයන්නෙකු බවත් වාර කීපයක්ම පොලිස් අත්අඩංගුවට පත්වී ඇති කපටි පුද්ගලයෙකු බවත් එළිවිය. (**ලක්බිම පුවත්පතිනි**)




**ඉරිදා - SUN** ලන්ඩන් ටෛම්ස් පත්තරේ මුල් පිටේ තිබුණා ඉන්දියාවෙ ටාජ් හෝටලේ ගිනිගන්න පොටෝ එකක්. යටින් ලියලා තිබුණා ඉන්දියාවේ ඛේදජනක තත්වය කියලා. ඒක දැක්කම හිතුණා කලාපෙ ලොකු අයියගෙත් ගණන් දැන් බිංදුවට බැහැලා බව. එහේ නායකයො දැන් ලෝකෙට දුක කියනවා, බලන්නකො අපට වෙච්චදේ කියලා. දැන් ඒ ගොල්ලන්ට තේරෙනවා ඇති ත්‍රස්තවාදෙ රහ. අපිටත් පුළුවන් කියන්න, තොපිට හොඳ වැඩේ වුණේ කියලා. ඒත් එහෙම කියන්න අපට හිතෙනනෙ නැහැ, ඒක බුදුන් උපන් දේශය හන්දා. අපි එහෙම හිතුවට ඉන්දියන් කාරයො අපි ගැන එහෙම හිතන්නෙ නැහැ. උන් හිතන්නෙ ලංකාව උන්ගෙ අත යටතෙ ඉන්න ඕන කියලා. ඉන්දියන්කාරයො තඹ සතේකට විස්වාස කරන්න බැරි ජාතියක්. බලන්නෙ උන්ගෙ බඩවියත ගැන විතරයි. මහ මැටිමෝල්ලූ.

**සඳුදා - MON** ලංකාවෙ බොරුකාරයො ඉන්න බව හැබැව ඒත් උන්ට අහුවෙන්න තරම් අපේ රටේ මිනිස්සු ඔච්චර මෝඩද කියලා මම කල්පනා කරනවා. වතුරෙන් දුවන කාර්එකක් කවුද හාදයෙක් හදලා තියනවයි කියලා ලංකාවෙ පත්තර වල ගියා. මේ පැට්‍රල් ඩීසල් අමාරු කාලේ ඒක්‍රමය රටට සම්පතක් කියලත් තිබුණා. මෙන්න දැන් පත්තර වල කියනවා ඒ මැන් හදපු වතුර කාර් එකකුත් නැතෙයි. හැබැයි වටේටම ලක්ෂ ගණනක පොලු තියලා මාරුවෙලයි කියලා. ලංකාවෙ මිනිස්සු රවට්ටන්න කොච්චර ලේසිද? මට මතක්වෙනවා කාලෙ කට ඉස්සර කවුද ඒ වගේම කෙනෙක් කොස් ඇටයක් රුපියල් 10 ගණනේ ඇට ලක්ෂ ගණනක් විකුණලා තියනවා, මේවා වැල් කොස් ය කියලා. තාම බලන් ඉන්නවලු වැලේ කොස් ගෙඩියක් හැදෙන කල්.

**කුජදා - TUE** මේ ඉන්දියාවෙ සමහර ප්‍රාන්තවල මිනිස්සු මීයො ඇතිකරනවා සිය ගණන්. නගර සභාවෙන් කිව්වට මීයන්ගෙන් මහාමාරිය කියන ලෙඩේ බෝ වෙනවයි කියලා මිනිස්සු උන්ව මී පාසානම් දාලා මරන්නෙ නෑ මොකද මීයා ගණදෙවියන්ගෙ වාහනේ හන්දා. ඒ විදිය ටම දැන් ලංකාවෙ කාක්කොත් වැඩි වෙලයි කියලා සීලවතී කුඩම්මා ලියලා එවලා තිබුණා. ලංකාවෙ අය දැන් ග්‍රහ අපල දුරුවෙන්න කියලා හරියට කපුටු දානෙ දෙනවා. ඉස්සර කපුටෙක් දැක්කම ගලක් ගහලා එළ වපු මිනිස්සු දැන් බොහොම භක්තියෙන් කපුටට කිරි බත් ගිල්ලවනවා, කපුටා සෙනසුරාගෙ වාහනේ කියලා. මිනිස්සුන්ගෙ නෙවෙයි කපුටන්ගෙ අපල නම් දුරුවෙලා.

**බුදදා - WED** ඇමරිකාවෙ ජනතාව බලාගෙන් ඉන්නවා ඔබාමා ඇමරිකාවෙ වැටිච්ච ආර්ථිකය ගොඩගන්න කල්. ඒත් ඔබාමා කෙලින්ම කියලා තිබුණා ඒ වැඩේ හිතපු තරම් ලේසි නැත කියලා. රාජ්‍ය ලේකම් හැටියට ක්ලින් ටන්ගෙ මායියා පත්කරගත්තටත් සමහරු බනිනවා. තවම කාටවත් කිසි දෙයක් හරියට කියන්න බැහැ ඔබාමා කොයි වගේ කෙනෙක් වෙයිද කියලා. මුස්ලිම් ලෝකෙ බලාගෙන ඉන්නවා ඔබාමාගෙ තාත්ත මුස්ලිම් නිසා ඒඅයගෙ පැත්තට ටිකක් ඔබාමා ඇලවේය කියලා. ඔබාමාගෙ තත්වය කම්බියෙ යන සර්කස් කාරයගෙ කාරිය වගේ, ඉතාම සීරුවෙන් ඉදිරියට යායුතු ගමනක්. ඔහොම අවදානමක් මීට පෙර හිටි කිසිම ඇමරිකන් ජනාධිපති කෙනෙකුට තිබුණෙ නැහැ.

**ගුරුදා - THU** ලංකාවෙ දැන් හුහක් දේවල් ප්‍රචාරය කරන්නෙ පිටරට දේවල් හැටියට. එංගලන්තයේ පුහුණුව ලත් විදුලි කාර්මිකයෝ. ලන්ඩන් පළපුරුද්ද ඇති වඩුකාර්මික යෝ. පිටරට සුදුසුකම් ලත් පයිප්ප බාස්ලා. ඔය ආදී විදියට. ඇඹුල්දෙනියෙ හංදියෙ ඉන්නවලු ඔක්ස්පර්ඩ් පේන්ටර්ස් කියලා බෝඩ්එකක් ගහගෙන ඒ වගේ බ්‍රිටිෂ් කොලිපයිඩ් තීන්ත බාස් කෙනෙක්. රන්ජිත්ලයි නුගේ-ගොඩ ගෙයි හුණුගාන්න මැන් ඇවිත්. හරියට බුලත්විඩ කනවලු. හුණු ගාන්න තියා තීන්ත කොස්ස අල්ලන්න දන්නෙ නැතිලු. තමුසෙ බුලත් කන්නත් ඉගෙන ගත්තෙ එංගලන්තෙන්ද කියලා රන්ජිත් අහලා. මැන් දවල්ට කාලා එන්නම් කියලා සල්ලිත් ඉල්ලන් ගිහිං ආයිත් ඇවිත් නෑ. රන්ජිත්ම හුණු ටික බිත්තිවල ගාගෙන.

**කිවිදා - FRI** ප්‍රභාකරන් අල්ලලා ඉන්දියාවට දෙන්නය කියලා ඉන්දියාවෙන් කලින් ඉල්ලලා තිබුණ වුනාට දැන් ඉන්දියාව කියනවලු අපෝ ඕකා එහෙම මේ හතර මායිමට එවන්න එපා, අපේ දැන් මේ ඔළුව පත්තුවෙලා ඉන්නෙ, අපිට දැන් මේ ඉන්න ත්‍රස්තවාදියො ටික හොඳටම ඇති, ඔය යකා මෙහේ ඇවිල්ලා ඒපාර තමිල් නාඩුව වනසාවි, ඒපාර ලංකාවෙ තිබිච්ච ඔක්කොම කරදර අපේ ඇඟට වැටේවි කියලා. 88 දි ඉන්දියාව ලංකාවට පරිප්පු දැම්මා, දැන් ඉන්දියාවම ඉල්ලන් පරි ප්පු කනවයි කියලා සෝමතුංග බාප්ප කියනවා. තමිල් නාඩුවෙ ඉන්න කරුණානිධිලා, වයිකෝලා ඇතුළු මන්ත්‍රීලයි එහේ ඉන්න සරුව පිත්තල නළුවො ටිකයි ලංකාවෙ දෙමළ සහෝදරගල් ලට සපෝට් එකට කියලා දවස් බාගෙක බොරු උපවාසයක් කළා. කොටි දන්නවා ඒ කරපු බොරුව. ප්‍රභාකරන් දැන් අඩනවලු.